# මව් බිමට සමීප වන්නට වරමක්

## සිරස ටීවී ඔස්ට්‍රේලියාවේ දී



සියළු රස සමගින් ශ්‍රී ලාංකික රූපවාහිනී ප්‍රේක්ෂක හද දිග් විජය කළ සිරස රූපවාහිණී නාලිකාව ශක්ති හා එම්ටීවී නාලිකා ද සමගින් ඔස්ට්‍රේලියාවේ හා නවසීලන්තයේ වෙසෙනෙ ශ්‍රී ලාංකිකයින් හට සජීවීව නැරඹීමේ පහසුකම දැන් උදා වී ඇත. ඒ සඳහා අනුග්‍රහය දක්වා ඇත්තේ ඔස්ට්‍රේලියාවේ ග්ලෝබල් නෙට් මීඩියා ආයතනය හා ශ්‍රී ලංකාවේ මහාරාජා ආයතනයයි. මේ නිසා සිංහලෙන් සිරස නාලිකාව ද දෙමලෙන් ශක්ති නාලිකාවද ඉංග්‍රීසියෙන් එම්ටීවී නාලිකාවද නැරඹීමේ පහසුකම ඔබට උදා වෙයි.




මෙහි ඇති අනෙක් විශේෂත්වය නම් අන්තර්ජාලය හරහා සම්බන්ධ වන ප්‍රථම රූපවාහිනී නාලිකා බවට මේ නාලිකා තුන පත් වීමයි.

මේ කරුණු අනාවරණය වූයේ ඒ සම්බන්ධයෙන් මාධ්‍ය දැනුවත් කිරීම සඳහා පසුගිය දා ජී එම් එන් ආයතනයේ දී පැවැත් වූ මාධ්‍ය හමුවේ දී ය. අපේ විමසීම් වලට කරුනු දැක්වූ එම ආතනයේ ප්‍රධාන තාක්ෂණ නිලධාරියා වන චමින්ද මෙන්ඩිස් මහතා තමන්ගේ අරමුණ වන්නේ ප්‍රේක්ෂකයාට හොඳ පැහැදිළි නාලිකා- වක් නැරඹීමට අවස්ථාව ලබා දීම බව පැවසුවේ ය. අන්තර්ජාල තාක්ෂණය උපයෝගී කර ගනිමින් මේ අරමුණ පසුරා ගන්නා අතර නරඹන්නන්ට සතුට දැණුම හා විනෝදය ත් ලබා දීම ට තමන් උතාසහ ගන්නා බවද ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු සඳහා ප්‍රධාන තැනක් ලබා දෙන බද ඒ මහතා වැඩි දුරටත් පැවසූවේ ය.

මේ නාලිකා නැරඹීම සඳහා ඇන්ටෙනා අවශ්‍ය නොවන අතර සියළු සම්බන්ධකම් සිදුවන්නේ අන්තර්ජාලය හරහා ය. ඔබට ඉතා කුඩා ප්‍රමාණයේ උපකරණයක් (සෙට් බොක්ස්) මිලට ගැනීමට සිදුවනු ඇත.

ආරම්භයේ දී පැය 6 ක් සජීවී වැඩ සටහනක් ලබා දීමට තමන් අදහස් කරන බවත් ඉදිරියේ දී මේ කාලය දීර්ඝ කිරීමටත් නව නාලිකා හඳුන්වා දීමටත් තමන් බලාපොරොත්තු වන බව මෙන්ඩිස් මහතා පැවසුවේ ය.

ඔබට අවශ්‍ය නම් ඔබේ දුරකථන අවශ්‍යතා හා අන්තර්ජාල සබඳතා රූපවාහිනිය සමග එකම පැකේජයක් ලෙස ඔබට ලබාදීමට ජී එන් එම් ආයතනය සූදානම් ය. ඔස්ට්‍රේලියාව තුළ නව ශ්‍රී ලාංකික රූපවාහිණී සංස්කෘතියක් ගොඩ නැගීම තමන්ගේ අරමුණ බව එම ආයතනය පවසයි..

සියළුම විමසීම්

73 - 75
William Road Dandenong 3175
Hotline 0433 216 477 / 0433 283 068
General Line 03 9793 3575
Fax 03 9793 3536

# මතකය ගමට රැගෙන ගිය ගී ප්‍රසංගයක්




ගම්මානයේ මල් පියසි, මියුරු කුරුළු ගී, ඇඳ හැලෙන දිය ඇලි, නිල්වන් කඳුගැටි මලින් සහ පලින් බර සුන්දර වටපිටාව දසත විහිදෙන කෙත්වත්.... මේ ආදීය මතකයට නැගෙ. ගී ප්‍රසංගයකට නිසොල්මනේ හිඳගෙන සවන් දීමට අවස්ථාවක් පසුගිය දිනෙක උදාවිය. ඒ සංගීත විශාරද වේරලියද්දයන් සංගීතවේදී නිරෝෂා විරාජනීය සමග එක්ව ගායනා කළ ගම්හානයේ ගී සැදෑවයි.

දේශයේ සහ කාලයේ අවශ්‍යතාවයන්ට අනුව යන්ත්‍ර බවට පත්ව, මිනිත්තු හෝරා සමග පොරබදන ජීවන රටාවක් ගතකරන අපහට මඳ වේලාවකට හෝ මෙවන් ගී සැදෑවක රසවිඳිමින් අතීත සුන්දර මතක සටහන් සිහියට නංවා එහි වින්දනය ලැබීමට අවස්ථාවක් ලැබීම සතුටට කරුණක් නො- වේද?

මෙල්බන් නගරයේ වෙසෙන අපහට මෙවන් අවස්ථා උදාවන්නේ මෙහි ඇති නොයෙකුත් සමිති සමාගම්වල අනුග්‍රහයෙනි. තම වටිනා කාලය වැය කරමින්, කැප කරමින් මෙවන් කටයුතු සංවිධානයකරණ සියලුම සංවිධානවල ශ්‍රී ලාංකිකයනහට අපගේ නොවක් තුතිය පිරිනැමීය යුතුය. මෙවන් සංවිධායක රාමුව තුළ බොහෝවිට දක්නට ලැබෙන්ෙ- න් එකම මුහුණුය. එම නිසාම ඔවුන් පෞද්ගලික ඵල ප්‍රයෝජනයක් නොලබා මේ කරණ සේවය වඩාත් අගය කලයුතු වන්නේය.

ගිම්හානයේ ගී ප්‍රසංගයේදී සේනානායක වේරලියද්දයන්ගේ ගැඹුරු කට හඬින් දේශීයත්වය ආරක්ෂා කර ගනිමින් ශබ්ද රසයෙන් මෙන්ම අර්ථ රසයෙන්ද මල්ඵල ගැන්වූ ගීතයක් අසන්නට ලැබුනේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමයේ අනුග්‍රහයෙනි.

මෙම ප්‍රසංගයට සංගීතය සපයන ලද්දේ ''සුපර් සහරා'' වාද කණ්ඩායමයි. මෙල්බන් තරුන කැලකින් සමන්විත මේ ශිල්පීන්හට තම කුසලතාවයන් තවදුරටත් මුවහත් කර ගැනීමට මෙය මහඟු අවස්ථාවක් විය.

ශබ්දාගාරයක් තුළ තැටි ගතකල සංයුක්ත තැටියකින් මා අසා ඇති වේරලියද්දයන්ගේ ගී සහ මීට ඉහත දී පැමිණි උපාලි කන්නංගරයන්ගේ ගී සජීවීව වේදිකාවක් තුළ එම ශබ්ද රසයට හානියක් නොවන ලෙස ඇසීමට ලැබීම නිසි නිදි නොලබා තම වටිනා කාලය කැප කරමින් පුරුදු පුහුණු වූ සූපර් සහරා සංගීතවේදීන්ගේ එම උත්සාහයේ මල්ඵල ගැන්වීමකි.

මේ කෙටි සටහන ඔවුනට ධෛර්ය ගෙනදෙනු වස් ඉදිරිපත් කරමි.

**රත්නපාල දිසානායක**
ක්‍රෙගීබර්න්

Sri lankan food is probably not that well-known to most people and this is the best place outside Colombo to get stuck into some of the treats the country is famous for. Try the crunchy masala wadai or godhamba, cubes of roti filled with beef, fish or vegies.

**Shihan's Chilli Bar**

137 Koornang Road Carnegie Phone 9572 2555




බොදු ගොවි වසය අවු 25 ක් වන දැනට ලංකාවේ වාසය කරන උගත් රූමත් නැගනියට සුදුසු සහක- රුවකු ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචි සොයුරියත් ලංකාවේ වෙසෙන ව්‍යාපාරික දෙමාපියෝත් සොයති. සියලු විස්තර සන්නස බාරේ SMP0006 Sannasa PO Box 172 Reservoir Vic 3073 ලිපිනයට එවන්න

ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය හිමි උගත් පැහැපත් අවු 33 ක් වන අඩි 5 ක් උසැති දියනියට සුදුසු විවාහයක් සඳහා ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය හිමි හෝ ඕස්ට්‍රේලියාවේ අවසාන වසරේ ඉගෙන ගන්නා උගත් අවංක මහත්මයෙකු සිය දෙමාපියෝ සොයති. කේන්ද්‍ර කොපිය අවශ්‍යයි.
email geekiyanage@yahoo.com

SMP0005

## Classifieds ලුහුඬු දැන්වීම්

First 25 words - $20.00 .
Each additional word $1.00

පළමු වචන 25 සඳහා ඩොලර් 20.00
අතිරේක වචනයක් ඩොලර් 1.00

**AUTO CARE**

**Kandy Lube**
**All Mechanical Repairs**
**Thomastown**
**03 9462 2199**

**GROCERIES**

For all your needs

Sooriya

Sri lankan Grocery
22 Lorne Street
Lalor 3075

**Tel 03 9402 5380**




**22 Lorne St**
**Lalor Vic 3075**

**1000 Businesscards**
**from $105**

**03 9402 5380**

Sannasa Advertising

සන්නස
වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Saliya Galappaththie**
Mobile : 0422 671 826
TP 03 9310 4196

**Asoka Subasinghe**
Mobile 0425 720 932
TP 03 9796 4241